අධිකරණ
දෙපාර්තමේන්තුව

ප්‍රවෘත්ති නිවේදනය

නොපමාව බෙදාහැරීම සඳහා

නිකොලා ටී. හැනා
එක්සත් ජනපද ඇටෝර්නි
කැලිෆෝනියා මධ්‍යම දිස්ත්‍රික්කය

තොම් මර්සෙක්
මාධ්‍ය සබඳතා අධ්‍යක්ෂ
thom.mrozek@usdoj.gov
(213) 894-6947

2021 ජනවාරි 8 වැනිදා

ISIS වෙත භෞතික සහය ලබාදීමට කුමන්ත්‍රණය කිරීම සම්බන්ධයෙන් විදේශිකයින් තිදෙනෙකුට එරෙහිව ලොස් ඇන්ජලීස් ෆෙඩරල් අධිකරණයේ චෝදනා ගොනුකෙරේ

මෙම තැනැත්තන්, 268 දෙනෙකුට මරු කැඳවමින් 2019 පාස්කු දින ශ්‍රී ලංකාවේ දී ත්‍රස්තවාදී ප්‍රහාර සිදුකළ ISIS ආධාරකරුවන් කණ්ඩායමක සාමාජිකයින් වූ බව කියැවේ.

ලොස් ඇන්ජලීස් හි දී - විදේශ ත්‍රස්තවාදී සංවිධානයක් වශයෙන් නම්කරන ලද සංවිධානයකට (ISIS) භෞතික සහය ලබදීමට කුමන්ත්‍රණය කිරීම ඇතුළු ත්‍රස්තවාදය සම්බන්ධ වරදවල් සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් තිදෙනෙකුට එරෙහිව නිල වශයෙන් චෝදනා එල්ල කර ඇති බව අධිකරණ දෙපාර්තමේන්තුව අදදින නිවේදනය කළේ ය. අද දින මුද්‍රා විවෘත කරන ලද ෆෙඩරල් අපරාධ පැමිණිල්ලකට අනුව, මෙම තැනැත්තන් "ශ්‍රී ලංකාවේ ISIS" (ISIS in Sri Lanka) යනුවෙන් හඳුන්වාගනු ලැබූ ISIS ආධාරක කණ්ඩායමක කොටසක් වන අතර, එක්සත් ජනපද පුරවැසියන් පස් දෙනෙකු ඇතුළුව 268 දෙනෙකුට මරු කැඳවමින්, තවත් 500 ඉක්මවන පිරිසකට තුවාල කරමින් 2019 පාස්කු දිනයේ දී, දකුණු ආසියානු රටක් වන ශ්‍රී ලංකාවේ සිදුකළ ප්‍රහාර සඳහා එම කණ්ඩායම වගකිවයුතු බවට චෝදනා කෙරේ.

2019 අප්‍රේල් 21 වැනි දින ශ්‍රී ලංකාවේ කොළඹ, මීගමුව සහ මඩකලපුව යන නගරවල එක ම විටක පාහේ සිදුකරන ලද මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර දක්වා මගපාදන ලද සිදුවීම් සහ එම කුමන්ත්‍රණය සඳහා මෙම විත්තිකරුවන් නිරූපණය කළ භූමිකා පැමිණිල්ලේ සැකෙවින් දක්වා තිබේ. මියගිය එක්සත් ජනපද පුරවැසියන් අතරින් එක් අයෙක්, රාජකාරි කටයුතු සඳහා ශ්‍රී ලංකාවට ගොස් සිටි වාණිජ දෙපාර්තමේන්තු සේවකයකු වේ.

ප්‍රහාරවලින් දින දෙකකට පසුව, එම මරාදැමීම් "Islamic State සටන්කරුවන්" විසින් සිදුකරන ලදැයි දක්වමින් එම ත්‍රස්තවාදී ක්‍රියාවන් තමන් විසින් සිදුකරන ලදැයි ISIS විසින් ප්‍රකාශ කරන ලදී. 2019 අප්‍රේල් අග භාගයේදී, සිරියාවේ බගුස් හි ඊට පෙර මාසයේ දී ISIS පරාජය කිරීම වෙනුවෙන් "බටහිර" ට එරෙහිව කල පලිගැනීමක් වශයෙන් හඳුන්වමින්, එකල ISIS නායකයා මෙම ප්‍රහාරය සිදුකළ පුද්ගලයින් වර්ණනා කළේ ය.

“ලෝකයේ කුමන හෝ ස්ථානයක දී ඇමරිකානු පුරවැසියන් ඉලක්ක කරන ත්‍රස්තවාදීන් යුක්තිය ඉදිරියට පමුණුවන බව සහතික කරගැනීමට එක්සත් ජනපදය ඒකාන්ත ක්‍රියාමාර්ග ගන්නා බව මෙයින් පැහැදිලිව ම පෙන්නුම් කරනවා” යනුවෙන් එක්සත් ජනපද ඇටෝර්නි නික් හැනා පැවසී ය. “වරදකරුවන් යුක්තිය ඉදිරියට පැමිණවීම සඳහා ශ්‍රී ලංකාවේ බලධාරීන්ට ඇති හැකියාව සම්බන්ධයෙන් එක්සත් ජනපදය විශ්වාසයෙන් සිටිනවා - විත්තිකරුවන් යුක්තිය මගහැර යන්නට වෑයම් දැරුවහොත්, අප මෙම චෝදනා සමගින් ඊට සූදානම්ව සිටින බව මෙම පැමිණිල්ලෙන් පැහැදිලිව පෙන්නුම් කරනවා.”

“ශ්‍රී ලංකාවේ සිදුවූ ISIS පාස්කු ප්‍රහාරවලින් ඇමරිකානු ජාතිකයින් පස් දෙනෙකු ඇතුළුව 268දෙනෙක් මරාදමනු ලැබුවා, ඉන් බොහෝදෙනා වන්දනාමාන කරමින් සිටින අතරේයි මෙය සිදුවුනේ” යනුවෙන් ජාතික ආරක්ෂාව පිළිබඳ සහකාර නීතිපති ජෝන් සී. ඩීමර්ස් සඳහන් කළේ ය. “එම මරණවල වගකීමෙහි ඔවුන් දැරූ කොටස වෙනුවෙන් අද අපි මෙම විත්තිකරුවන්ට චෝදනා එල්ල කරනවා. එම චෝදනාවලට අනුව මෙම විත්තිකරුවන් ISIS වෙනුවෙන් කැපවූ ආධාරකරුවන්, ISIS හි ප්‍රචණ්ඩ අභිප්‍රායන් සඳහා අනෙකුත් අය බඳවාගෙන තිබෙනවා, IED සඳහා අමුද්‍රව්‍ය මිලට ගෙන ඒවා සාදා තිබෙනවා, ප්‍රහාරවලට සහභාගි වූ අනෙකුත් අය සූදානම් කිරීමටත් පුහුණු කිරීමටත් උදවු කර තිබෙනවා, මෙම භයාන විදේශ ත්‍රස්ත සංවිධානයේ නාමයෙන් මිනීමැරීම් සිදුකර තිබෙනවා. ඔවුන් ශ්‍රී ලංකාවේ අත් අඩංගුවේ පසුවනවා. මේ ත්‍රස්තවාදීන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ සිදුකෙරෙන විමර්ශනය සහ නඩුපැවරීම සඳහා අප සම්පූර්ණයෙන් ම සහය

ලබාදෙන අතර මෙම විත්තිකරුවන් ඔවුන්ගේ අපරාධ සඳහා වගවන බව සහතික කරගැනීමේ අපගේ පොදු පරමාර්ථය හඹායාම සඳහා අපි එරට බලධාරීන් සමගින් තවදුරටත් වැඩ කරනවා. ඒ සමග, විදේශ රටවල දී අපගේ පුරවැසියන්ට හානිකරන තැනැත්තන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීම සඳහා එක්සත් ජනපද අධිකරණ පද්ධතිය තවදුරටත් බලවත් මෙවලමක් වන බව මෙම චෝදනාවලින් පිළිබිඹු කෙරෙනවා. මෙම සාහසික ප්‍රහාරවල වින්දිතයින් වෙනුවෙන් සහ ත්‍රස්තවාදයේ වින්දිතයින් වූ සියළුම ඇමරිකානු ජාතිකයින් වෙනුවෙන් අපි නොනැවතී යුක්තිය සොයා යනවා."

ලොස් ඇන්ජලීස් නුවර එක්සත් ජනපද දිස්ත්‍රික් අධිකරණයේ දෙසැම්බර් 11වැනි දින ගොනුකරන ලද අපරාධ නඩුකරය, ක්‍රිස්තියානි පල්ලි සහ බටහිර රටවල පුරවැසියන් නිතර යන එන සුඛෝපභෝගී හෝටල් ඉලක්ක කරගනිමින් සිදුකළ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර සිදුවීමෙන් අනතුරුව ශ්‍රී ලංකාවේ බලධාරීන්ට සහයෝගය ලබාදුන් FBI ආයතනය විසින් දෙවසරකට ආසන්න කාලයක් සිදුකරන ලද විමර්ශනයක ප්‍රතිඵලයයි.

"විදේශ රටක සිදු වූ ප්‍රහාරයක් සම්බන්ධයෙන් දේශීයව අද නිවේදනය කළ මෙම චෝදනා, සංචාරය කරන ඇමරිකානු වින්දිතයින් වෙනුවෙන් යුක්තිය ලබාදීමටත් මෙරට සහ විදේශයන් හි ඇමරිකානු ලැදියාවන් ආරක්ෂා කිරීමටත් FBI දක්වන කැපවීම නියෝජනය කරනවා" යනුවෙන් ලොස් ඇන්ජලීස් නුවර FBI ක්ෂේත්‍ර කාර්යාලය භාර සහකාර අධ්‍යක්ෂ ක්‍රිස්ටි කේ. ජොන්සන් පැවසුවා ය. "දශක ගණනාවක සිට, සහ විශේෂයෙන්ම 9/11 සිදුවූ පසුව, ගෝලීය වශයෙන් ත්‍රස්තවාදයට එරෙහිව සටන්වැදීම සඳහා වන පොදු අරමුණ වෙනුවෙන්, විමර්ශනමය අවකාශයන් ඇතිකරගැනීමටත් ඒ ඒ රටවල අදාළ පාර්ශව සමගින් සම්බන්ධීකරණය කිරීමටත් FBI ආයතනය ලෝකයේ විවිධ රටවලට නියෝජිතයින් යොදවා තිබෙනවා. අප දිගින්දිගටම බලාපොරොත්තු වන්නේ දේශීයව හෝ විදේශීයව සිදුකෙරෙන සාපරාධී නඩුපැවරීම් ඔස්සේ මේ භයංකර ප්‍රහාරය හේතුවෙන් ශ්‍රී ලංකාවේ දී මියගිය හෝ තුවාල ලැබූ සියගණනක් වින්දිතයින් වෙනුවෙන් යම් හෝ අන්දමක සාමයක් ලැබෙනු ඇතැයි යන්නයි."

මෙම ප්‍රහාර හා සම්බන්ධ යැයි සැක කෙරෙන අනෙකුත් පුද්ගලයින් ද සමගින්, මෙම පැමිණිල්ලේ නම් කර ඇති විත්තිකරුවන් දැනට ශ්‍රී ලංකාවේ රැඳවුම් භාරයේ සිටින අතර මේ සම්බන්ධයෙන් එහි දැනට අපරාධ විමර්ශනයක් සිදුකෙරෙමින් පවතියි.

පැමිණිල්ලට අනුව, චූදිත විත්තිකරුවන් තිදෙනා සහ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයේදී මියගිය ත්‍රස්තවාදීන් අට දෙනා ඇතුළුව මෙම කුමන්ත්‍රණයට සම්බන්ධ අනෙකුත් අය, (1) ISIS කෙරෙහි, එහි දෘෂ්ටිවාදය කෙරෙහි සහ ISIS අරමුණු ඉදිරියට ගෙනයෑමට ප්‍රචණ්ඩ ප්‍රහාර සැලසුම් කිරීම හා දිරිගැන්වීම කෙරෙහි කැපවුණු ISIS ආධාරකරුවන් කණ්ඩායමක් ශ්‍රී ලංකාවේ නිර්මාණය කිරීම, පවත්වාගෙන යාම සහ එහි සාමාජිකයින් වශයෙන් කටයුතු කිරීම; (2) පුපුරන ද්‍රව්‍ය සහ IED සංඝටක ලබාගැනීම; (3) අවසානයේ දී ප්‍රහාරයට යොදාගත් වර්ගයේ IED ද ඇතුළුව IED නිපදවීම සහ පරීක්ෂා සිදුකිරීම; (4) ශ්‍රී ලංකාවේ ISIS කණ්ඩායම සඳහා තවත් සාමාජිකයින් බඳවාගැනීම; (5) ප්‍රහාරය සිදුකළ අයට සහ ඒ අයගේ සම-කුමන්ත්‍රණකරුවන්ට ගිනි අවි සහ පුපුරන ද්‍රව්‍ය පරිහරණය සම්බන්ධයෙන් උපදෙස්දීම හා පුහුණු කිරීම සඳහා ISIS විසින් නිර්මිත පුහුණු ද්‍රව්‍ය යොදාගැනීම; (6) නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් අතින් අනාවරණය වීම මගහැර යමින් පාස්කු ප්‍රහාර ඇතුළුව ISIS නාමයෙන් ප්‍රහාර සඳහා සූදානම් වීමට කණ්ඩායමට රැකවරණ ස්ථාන ප්‍රසම්පාදනය කිරීම; (7) සාපරාධී කුමන්ත්‍රණ සඟවා තබාගැනීම පිණිස end-to-end encrypted තාක්ෂණය සහිත විශේෂිත පණිවුඩ යෙදුම් (messaging applications) භාවිතය සඳහා ISIS විසින් ලබා දී ඇති විධාන පිළිපැදීම; (8) එම නිලධාරීන්ගේ ගිනිඅවි ලබාගැනීම සඳහා ශ්‍රී ලාංකික පොලිස් නිලධාරීන් දෙදෙනෙකු මරා දැමීම; සහ (9) පොලිස් ඔත්තුකරුවකු වශයෙන් සැකකළ තැනැත්තකු මරා දැමීම ඇතුළු විවිධ ක්‍රියා ඔස්සේ ISIS වෙත සේවාවන් සහ පුද්ගලයින් ඇතුළුව භෞතික සහය ලබාදීමට කුමන්ත්‍රණය කිරීම, ඒවා ලබාදීම සහ ලබාදීමට වෑයම් කිරීම සිදුකර තිබේ.

සාපරාධී පැමිණිල්ලේ නම් කර ඇති විත්තිකරුවන් තිදෙනා පහත දැක්වේ. මේ සියළු දෙනා ISIS කෙරෙහි පක්ෂපාතීවීමට ප්‍රතිඥාදුන් අය වේ:

- මොහොමඩ් නවුෆර්, "ශ්‍රී ලංකාවේ ISIS" (ISIS in Sri Lanka) යනුවෙන් හඳුන්වාගත් ISIS ආධාරකරුවන් කණ්ඩායමේ "දෙවන එමිර්වරයා" වේ. කණ්ඩායමේ ප්‍රචාරක වෑයම් සඳහා නායකත්වය දීම, ISIS සමගින් සම්බන්ධවීමට තවත් අය බඳවාගැනීම සහ මිලිටරි-වර්ගයේ බහු-දින පුහුණු මාලාවක් පැවැත්වීම සම්බන්ධයෙන් චෝදනා ඇත;

- මොහොමඩ් අන්වර් මොහොමඩ් රිස්කාන්, පාස්කු ප්‍රහාරවලට යොදාගත් IED නිෂ්පාදනය සඳහා සහය දුන් බවට චෝදනා ඇත;
- අහමඩ් මිල්හාන් හයාතු මොහොමඩ්, පොලිස් නිලධාරියකුගේ ගිනිඅවිය ලබාගැනීම සඳහා එම පොලිස් නිලධාරියා මරාදැමීම, පොලිස් ඔත්තුකරුවකු බවට සැකකළ තැනැත්තකුට වෙඩි තැබීම සහ වෙනත් ත්‍රස්ත ප්‍රහාරයක් සඳහා සූදසු ස්ථානයක් සම්බන්ධයෙන් සොයාබැලීම සිදුකළ බවට චෝදනා ඇත.

විදේශ ත්‍රස්තවාදී සංවිධානයක් වශයෙන් නම් කරන ලද සංවිධානයකට භෞතික සහය ලබාදීමට කුමන්ත්‍රණය කිරීම, ලබාදීම සහ ලබාදීමට වෑයම් කිරීම සම්බන්ධයෙන් මේ විත්තිකරුවන් තිදෙනාට ම චෝදනා ගොනුකර තිබේ. තවද, ISIS වෙතින් මිලිටරි-වර්ගයේ පුහුණු ලැබීමට ආධාරදීම සහ අනුබලදීම සම්බන්ධයෙන් නවූෆර් සහ මිල්හාන් වෙත චෝදනා එල්ල කර තිබේ.

භූමිප්‍රදේශයෙන් බැහැර කරුණු සඳහා වගකීම් පවරා ඇති කාර්යමණ්ඩලය ඇතුළුව ලොස් ඇන්ජලීස් නුවර පිහිටා ඇති FBI නායකත්වයෙන් යුත් ඒකාබද්ධ ත්‍රස්තවාද කාර්යසාධක බලකාය (Joint Terrorism Task Force) මෙම විමර්ශනය සඳහා නායකත්වය ගනියි.

සහකාර එක්සත් ජනපද ඇටෝර්නිවරුන් වන ඇනාමාර්ටින් සැලික්, ජෝර්ජ් ඊ. පෙන්ස් IV සහ ත්‍රස්තවාදය සහ අපනයන අපරාධ අංශයේ ක්‍රිස්ටීන් රෝ, සහ ජාතික ආරක්ෂක කොට්ඨාසයේ ප්‍රතිත්‍රස්ත අංශයේ නඩුවිභාග ඇටෝර්නි ඇලිෂියා කුක් විසින් මෙම නඩුකටයුත්ත ගෙනයනු ලැබේ.

අපරාධ කොට්ඨාසයේ ජාත්‍යන්තර කටයුතු කාර්යාලය සහ ලොස් ඇන්ජලීස් හි County Sheriff's Department මෙහිදී අගනා සහයෝගයක් ලබා දී ඇත.

Release No. 21-006